# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## විවෘත සහ දූරස්ථ අධ්‍යයන කේන්ද්‍රය

Centre for Open and Distance Learning
University of Kelaniya-Sri Lanka

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය
(බාහිර) - 2009

මානවශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව - **DMAT -E1025**

### ශ්‍රී ලංකාවේ නාට්‍ය හා රංග කලාව

<u>ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න</u>

ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි　　　　කාලය : පැය 03 යි

---

01. නාට්‍යමය ලක්ෂණ අන්තර්ගත බෞද්ධ ධර්ම දේශනා ක්‍රම අතරින් **<u>ආලවක දමනය</u>** විශේෂත්වයක් ගන්නේ ඇයි දැයි යන්න හේතු සහිතව පෙන්වා දෙන්න.

02. "දහඅට සන්නිය නාට්‍යමය ගුණයෙන් මෙන් ම විවිධත්වය, විචිත්‍රබව හා රසභාව උද්දීපනය අතින් පොහොසත් ශාන්තිකර්මයකි." විමසන්න.

03. **<u>සොකරි</u>** ගැමි නාටකයේ දිස්වන අභිචාරමය ලක්ෂණ පිළිබඳ විග්‍රහයක් කරන්න.

04. සම්ප්‍රදායික කෝලම් රංගයක චරිත වර්ග, ජවනිකා හා කතා පුවත් ඉදිරිපත් කෙරෙන අනුපිළිවෙල පිළිබඳ විමසීමක් කරන්න.

05. රැඟුම ආරම්භය, චරිත හඳුන්වාදීම , කතා වස්තු අනාවරණය යන කරුණු කෙරෙහි අවධානය යොමු කරමින්, පැරණි නාඩගමක රංග ආකෘතිය (ප්‍රාරම්භ පූර්ණ විරිදුව සිට මංගලම් ගීතය දක්වා) විස්තර කරන්න.

06. **<u>නූර්ති</u>** සම්ප්‍රදාය, සිංහල ගැමි නාටකවලට වඩා වෙනස් මගක් ගන්නේ කුමන ආකාරයෙන් ද යන්න පැහැදිලි කරන්න.

07. ලංකා විශ්වවිද්‍යාල යුගයේ අනුවර්තන හා පරිවර්තන නාට්‍ය නිෂ්පාදන මගින් මෙරට රංග කලාවේ දියුණුවට සිදු වූ මෙහෙය පිළිබඳ විමසීමක් කරන්න.

08. තේමා, චරිත නිරූපණය හා රංග ශෛලිය කෙරෙහි අවධානය යොමු කරමින් මෑත කාලීන කෙටි නාට්‍ය ප්‍රවණතාවය පිළිබඳ විවරණයක් කරන්න.

09. මතු දැක්වෙන නාට්‍යකරුවන් අතරින් **<u>එක්</u>** අයෙකු තෝරාගෙන ඔහුගේ නිර්මාණ දායකත්වය ඇගයීමට ලක් කරන්න.

    (අ) සුගතපාල ද සිල්වා
    (ආ) ගාමිණී හත්තොටුවේගම
    (ආ) පරාක්‍රම නිරිඇල්ල
    (ඇ) සෝමලතා සුබසිංහ

*************************